# මානව හිමිකම් සහ කාන්තා අයිතිවාසිකම්

"කාන්තාවන්ට එරෙහිව දියත්වන ප්‍රචණ්ඩත්වය" මුලික කර ගනිමින් දින 16ක් පුරා දියත්වන වැඩ පිළිවෙලක නිමාව දකින්නේ දෙසැම්බර් 10 වන දිනය. ලෝකය පුරා මෙම වැඩසටහන වසරක් පාසා ක්‍රියාත්මක කිරීම දැන් සම්ප්‍රදායක්ව ඇත. මෙම වසරේ ජාත්‍යන්තර තේමාව වූයේ "යුධ ගැටුම් නිසා විපතට පත් ස්ත්‍රීන්ගේ අයිවාසිකම් සුරකිමු" යන්නය.

දෙසැම්බර් 10 වන දින වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහා කොමසාරිස්වරියගේ නිල ප්‍රකාශනයේ මූලික අවධානය යොමුව ඇත්තේ මානව හිමිකම් ක්‍රියාධරයන්ට එරෙහිව එල්ල වන තර්ජන කෙරෙහිය. ඇයගේ ස්ථාවරය වන්නේ මානව හිමිකම් ක්‍රියාධරයන්ට මෙවැනි තත්වයන්ට මුහුණ දෙන්න වන්නේ නම් මානව හිමිකම් ආරක්ෂා කිරීමට මෙය මහත් බාධාවක් වන බවය. පසුගිය දශක කිහිපය පුරා මානව හිමිකම් උල්ලංඝනයන් වඩාත් පැතිරුණා මිසක ඒවයේ අඩුවක් නොවූ බව අපි දනිමු. යුද්ධයට මුවා වී විවිධ මර්ධන නිති යොදා ගනිමින් දේශපාලනඥයන් ද" පොලිසියද මුළු මහත් රාජ්‍ය තන්ත්‍රයම සුළු අපරාධ මැඬලීම සම්බන්ධයෙන් සිට මහා පරිමාණ අපරාධ මෙන්ම සිය දේශපාලනයට අභියෝග එල්ල කරන්නන්ට එරෙහිව ද කටයුතු කර ඇත.

යුද්ධය නිමාවීමත් සමගම මෙම මර්ධනයේ බලපෑම මුළු මහත් සමාජයටම මේ වන විට දැනෙන්ට පටන් ගෙන ඇත්තේ" උතුර සහ දකුණ වශයෙන් වෙන්ව නොව සමස්ත ලාංකික සමාජයටම මහත් පීඩාවක් ගෙන දෙමිනි. පසුගිය සති කිහිපය තුලම සිදුවුනු මිනිමැරුම් සහ අතුරුදහන් කරවීම් සම්බන්ධයෙන් චෝදනා ලැබූ බොහෝ දෙනා හමුදා පුහුණුව ලත් අය විය. අප ඉදිරියේ නොවිසඳුන ප්‍රශ්ණ ගනණාවක් තවමත් ඉතිරි කර ඇති භාරත ලක්ෂමන් මහතාගේ ඝාතනය මීට කදිම නිදසුනකි. යුධ සමයේ ඇතිවූ මිලිටරිකරණය නිසා උද්ගත වී ඇති තත්වය මනාව නිරූපණය කරන්නේ භාරත ලක්ෂ්මන් මහතාගේ මෙම ඝාතනයෙනි. දේශපාලන බලය" අවි ආයුධ සංසරණය" පාතාල ලෝකය සහ දේශපාලන බලය අතර ඇති අන්තර් සම්බන්ධතාවය" පොලිසියේ දේශපාලනීකරණය" නීතියේ ආධිපත්‍ය සුරැකීම කෙරේ එල්ල කර ඇති තර්ජනය පුරවැසියන් වශයෙන් අපට සුළු කොට තැකිය නොහැක. අමතක කළ යුතු ද නැත. මෙම ඝාතනය හුදෙක් පුද්ගලයන් දෙදෙනෙක් අතර ඇති වූ ගැටුමක ප්‍රතිඵලයක් නොව මානව හිමිකම් කඩා වැටීමේ පිළිඹුවක් වශයෙන් අපි දකිමු.

මේ වන විට අයිතිවාසිකම් පිළිබඳ සංවාදය රටේ පාලකයන් දකින්නේ සිය බලයට එරෙහිව නඟන හඬක් වශයෙනි. මේ නිසාම විරෝධතාවයන් ලත් තැනම ලොප් කිරීමට වෙර දරති. තර්ජනය කිරීම" බිය වැද්දීම මෙන්ම මුදල් යහමින් ලබා දෙමින් විපතට පත් පවුල් නිහඬ කරවීම වැනි උපක්‍රම යොද ගැනීම සුලභය. පුරවැසි සමාජය තුල මේ නිසා මතුව ඇත්තේ මහත් භීතියකි. කළු ගලේ ඔළුව හප්පා නොගනු! ඒ මෙම මර්ධනයේ හඬය.

මේ තත්වය යටතේ බොහෝ අසරණ තත්වයට පත්ව ඇත්තේ කාන්තාවන් බව අපි කල්පනා කරමු. ලාංකික සමාජය සුදු සාරි හැඳගත් ස්ත්‍රීන් ද" කළු සාරි හැඳගත් ස්ත්‍රීන් කෙරේද අවධානය යොමු කළ යුතු කාල පැමිණ ඇත. අවනීතිය සහ මර්ධනය මේ නිර්මාණය කර ඇත්තේ සුබ අනාගතයක් නොවන බව මෙම කාන්තාවන් අප ඉදිරියේ පෙන්වා දී ඇත. විරුද්ධ පාක්ෂිකයන් හිරේ විලංගුවේ දැමුවා පමණක් නොව අතුරුදහන් කෙරුවා පමණක් නොව ඝාතනය කළ බවද මේ බිරින්දෑවරුන් අපට පෙන්වා දී ඇත. උතුරු සහ දකුණ අද යා කෙරෙන්නේ මෙම යථාර්තයෙනි. මේ තත්වය අප තේරුම් ගත යුත්තේ හුදෙක්ම පෞද්ගලිකව ඔවුන්ට සිදුවුනු අකරතැබ්බයක් වශයෙන් පමණක් නොව ලාංකික දේශපාලන චර්යාධර්මයෙන් බිඳ වැටීමක් වශයෙනි.

දස දහසක් වන විපතට පත් වූ කාන්තාවන්" සිය නැතිවූ පවුලේ ඥාතීන් සොයමින් ඔබ මොබ දුවන උතුරේ කාන්තාවන් ද" සිය ඥාතීන්ට සිදුවූ අසාධාරණයට එරෙහිව යුක්තිය සොයමින් අධිකරණය වෙත යන සන්ධ්‍යා එක්නැලිගොඩ" අනෝමා ෆොන්සේකා සහ සුමනා ප්‍රේමචන්ද්‍ර ද මේ යථාර්තය නිරූපණය කරයි. මේ සියළු ස්ත්‍රීන්ගේ අනාගතය කෙබඳු වේද? මන්නාරමේ ලෙව්වම්ටත්" ත්‍රිකුණාමලයේ රිසානා නෆික්ටත්" සංහිඳියා කොමිසම ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කළ කාන්තාවන් 200 දෙනාටත් "සුබ අනාගතයක්" ඉතිරිව ඇත්තේද?

මානව හිමිකම් සම්බන්ධයෙන් ව්‍යාජ තොරතුරු සහ දත්තයන් සහිතව සකස් කළ වාර්තා එක්සත් ජාතීන්ගේ සංවිධානයත්" පොදුවේ ජාත්‍යන්තර ප්‍රජාව හමුවේත් ඉදිරිපත් කරමින් ඔවුන් නොමඟ යැවීම

මෙම රජය පුරුද්දක් කර ගෙන ඇත. එසේම යුද්ධය සහ මව්බිමේ අභිමානය දක්වමින් මානව හිමිකම් සම්බන්ධයෙන් සිය වගවීම පැහැර හැරීම  පාලනයේ චර්යාව බවට පත් කර ගෙන ඇත.

අනිත් අතට කාන්තා අයිතිවාසිකම් පිලිබඳවත් ගෘහස්ථ හිංසනය සහ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් පියවර ගැනීමත් මඟ හරින්නේ “අපේකම සහ අපේ සංස්කෘතිය” වැනි ප්‍රවාදයන් යොදා ගනිමින් පුරුෂාධිපත්‍යය රජයන සමාජයක් ගැන පුරසාරම් දොඩමිනි. මේ නිසාම ගත යුතු වන නීතිමය ක්‍රියා මාර්ග ගැනීමෙන් වැළැකී සිටීමට අපව යොමු කරවයි. මේ නිසාම නීතිය ලියවිල්ලකට සීමාවන තත්වයක් උදාකර ඇත. එසේම සමාජය තුල මානව හිමිකම් සහ ක්‍රියාධරයන් සම්බන්ධයෙන් ක්‍රෝධයක්" වෛරයක් ඇති කරවමින් අවනීතිය රජයන්නට ඉඩකඩ සලසා ඇත.

2005-2009 තුල කාන්තා පිහිට ආයතනයෙන් කාන්තාවන් 219"825 සහය පතා ඇති බව වාර්තා වී ඇත. මෙය බරපතල තත්වයක් ලෙස අපි දකිමු. මෙය වාර්තා වූ සංඛ්‍යාව පමණි. එසේම දිනපතා පුවත්පත් වාර්තා වලට අනුව ස්ත්‍රීන් අපයෝජනයේ යෙදවීම" පවුල් ආරවුල් නිසා ඝාතනය කිරීම සහ ග්‍රිස් යකා වැනි තත්වයන් නිර්මාණය කරමින් හිංසනයට ලක් කිරීම සුළු කොට තැකිය නොහැක. උතුරේ නිසි හවිහරණක් නොමැතිව නැවත පදිංචියට යන ස්ත්‍රීන් මුහුණ දෙන ලිංගික අතවරයන් සම්බන්ධයෙන් නිරන්තරයෙන්ම අපට අසන්නට ලැබේ. පවතින හමුදා පාලන තත්වය තුල මෙම සිදුවීම වාර්තා කිරීමට නොහැකිව ඇති බව අපි සඳහන් කරන්නේ වගකීමකින් යුතුවය.

පශ්චාත් යුධ තත්වය තුල ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩිවී ඇත.

මානව හිමිකම් භුක්ති විඳිය හැක්කේත්" එම සාරධර්ම ප්‍රගුණ කළ හැක්කේත්" ප්‍රජාතන්ත්‍රවාදයට සහ නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය තිබෙන යහපාලනයක් සහිතවූ දේශපාලන වටපිටාවක් තුල පමණි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගැනීමත් සමගම ලංකාවේ දේශපාලනය ඒකාධිපති පාලනයක් කරා යන මාවතකට එළඹ ඇත. මේ වන විට පාර්ලිමේන්තුව තුල ආණ්ඩු පක්ෂයේ හැසිරීම මේ බව සනාථ කරයි. එසේම හදිසියේ අණපනත් සම්මත කර ගනිමින් රටේ බලය පමණක් නොව සම්පත් ද කොල්ලකන චෞර රාජ්‍යක් බවට ශ්‍රී ලංකාව පත් ව ඇත.

කාන්තා අයිතිවාසිකම්" මානව අයිතිවාසිකම් වශයෙන් පිළිගැනීමට මෙම රජය අපොහොසත්ව ඇත. ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්තිය තුල අයිතිවාසිකම් හුදෙක්ම  පෝෂණ මල්ලට දරුවන් පිලිසිඳ ගැනීමට දෙන ප්‍රසාද දීමනාවට ලඝු කරමින්  අපගේ කාර්යය හුදෙක්ම මවුවරුන්ගේ භූමිකාවට පමණක් සීමා කිරීමේ ප්‍රතිගාමී තත්වයක පවතී. එසේම යුධ ගැටුම් නිසා විපතට පත් කාන්තාවන් සම්බන්ධයෙන් දක්වන ආකල්පය ද ඍණාත්මක තත්වයක පවතී. දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ගෙනායුතු නීති සංශෝධන ඉදිරිපත් කිරීමෙන් ද වැළැකී සිටින්නේ ස්ත්‍රීන් සම්බන්ධයෙන් ඇති මෙම පසුගාමී මතවාදය නිසාය.

නීතියට ගරු කරන දේශපාලනයක් වෙනුවෙන් පෙනී සිටිමු!

කාන්තා අයිතිය මානව අයිතිවාසිකමක් වශයෙන් පිලිගන්නා සමාජයක් කරා පිය මනිමු!

දේශපාලනයේ කාන්තා නියෝජනය 30% කිරීම නීති ගත කරනු!

ස්ත්‍රියගේ ආත්ම ගරුත්වය සහ සමානාත්මතාවය සුරැකීම ලාංකික දේශපාලනයේ මුදුන් මල්කඩ බවට පත් වන දිනය ප්‍රාර්ථනා කරමු!

කාන්තා දේශපාලන පිඨය

අංක 139/ඒ" ආනන්ද රාජකරුණා මාවත" කොළඹ 10

ටයිටස් ප්‍රනාන්දු වන මා විසින් කාන්තා දේශපාලන පිඨය වෙනුවෙන් මුද්‍රණය කර බෙදු හරීන ලදි. අංක 139/ඒ" ආනන්ද රාජකරුණා මාවත" කොළඹ 10